සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

II ශ්‍රේණියේ සහකාර රේගු අධිකාරිවරුන් සඳහා පැවැත්වෙන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය (නව නිර්දේශය) - 2017 (I) (2018)

## (01) රේගු නීතිය හා පසුබිම

පැ තුනයි

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1. රේගු ආඥාපනතේ 8 (1) වගන්තිය යටතේ මෙහෙයවන රේගු පරීක්ෂණයක දී පරීක්ෂණ නිලධාරියාට සහය වන නිලධාරියාගේ (Prosecuting officer) රාජකාරි මොනවාදැ'යි විස්තර කරන්න. *(ලකුණු 20 යි)*

2. ඔබ රේගු නිලධාරියකු ලෙස විමර්ශණයක් සිදුකරන අතරතුර දී සැකකරුවන් විසින් රේගුවට ඉදිරිපත් කරන ලද ලේඛන සමහරක් කූඨ ලෙස සකසා ඇති බව අනාවරණය වේ. එවැනි අවස්ථාවක දී ඔබ රේගු ආඥාපනතේ කවර වගන්ති අනුව පියවර ගන්නේ ද? එම වරද රේගු ආඥාපනතේ අදාළ වගන්ති යටතේ සාර්ථක ලෙස ඔප්පු කිරීමට විමර්ශන කටයුතුවල දී ගතයුතු ක්‍රියාමාර්ග කවරේ ද? *(ලකුණු 20 යි)*

3. ජාත්‍යන්තර වශයෙන් තහනමට ලක්කර ඇති මත්ද්‍රව්‍ය තොගයක් බහළුමක් තුළ සඟවා ශ්‍රී ලංකාවේ වරායක් හරහා සංක්‍රමණය (Transit) වන බවට ඔබට තොරතුරක් ලැබේ. එවිට ඔබ රේගු ආඥාපනත හා අනිකුත් අණපනත් ප්‍රකාරව ක්‍රියා කරන්නේ කෙසේ ද? *(ලකුණු 20 යි)*

4. බහළුම් පරීක්ෂාකරන අංගනයක ඔබ සේවය කරන විට දී ඔබගේ අධීක්ෂණ නිලධාරියා විසින් වැඩි අවදානම් භාණ්ඩ ලෙස (High Risk) පරිගණක පද්ධතියෙන් තෝරා නම් කරන ලද බහළුමක් පරීක්ෂාකිරීමට ඔබ වෙත යොමු කෙරේ. එම බහළුම ඔබ විසින් පරීක්ෂාකිරීමේ දී ආනයනය තහනම් භාණ්ඩ තොගයක් හමුවේ. එවිට ඒ සම්බන්ධව රේගු හා අනුෂාංගික නීති අනුව කටයුතු කරන අන්දම විස්තර කරන්න. *(ලකුණු 20 යි)*

5. "රේගු ආඥාපනතේ විධිවිධානයන්ට පටහැනිව ආනයනකරුවන් හෝ අපනයනකරුවන් විසින් සිදුකරනු ලබන ක්‍රියාවන් වැළැක්වීම රේගු නිවාරණ නිලධාරියකුගේ රාජකාරිය වේ." මෙම ප්‍රකාශය තර්කානුකූලව විමසන්න. *(ලකුණු 20 යි)*

6. අමුද්‍රව්‍ය ආනයනය කර නිමි ඇඳුම් නිපදවා අපනයනය කරන ආයතනයක බැඳි ගුදම තුළ ගබඩා කර තිබූ තීරුබදු නොගෙවූ රෙදි තොගයක් නීති විරෝධී ලෙස පිට කළ බවට තොරතුරක් ඔබට ලැබේ. මෙයට අදාළ රේගු ආඥාපනතේ වගන්ති ඇසුරින් මෙම විමර්ශණය සිදු කරන අයුරු විස්තර කරන්න. *(ලකුණු 20 යි)*

7. කෙටි සටහන් ලියන්න.
   - (i) ආනයනය තහනම් කරන ලද හෝ සීමා කරන ලද භාණ්ඩ (Goods Prohibited or Restricted for importation)
   - (ii) නැව් භාර පත (Bill of Lading)
   - (iii) ප්‍රති ආනයනය (Re-Import)
   - (iv) බුද්ධිමය දේපළ ගණයට අයත් වන භාණ්ඩ (IPR related goods) *(ලකුණු 05 × 4 = 20 යි)*

8. අවුරුදු දෙකක් මැද පෙරදිග රටක සේවය කර ලංකාවට පැමිණෙන ශ්‍රී ලාංකිකයකු තමා විසින් මිල දී ගත් භාණ්ඩ අඩංගු ලී පෙට්ටි තුනක් සිය කැටුව නොගෙන ගමන් බඩු ලෙස නැව් මගින් ගෙන එයි. එම පෙට්ටි පරීක්ෂා කිරීමේ දී එය තුළ වෙළෙඳ ප්‍රමාණයන්ගෙන් භාණ්ඩ ඇති බව අනාවරණය වූ විට ඔබ සහකාර ගාස්තු නිලධාරියකු ලෙස රේගු නීතිය අනුව කටයුතු කරන අන්දම විස්තර කරන්න. *(ලකුණු 20 යි)*

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

II ශ්‍රේණියේ සහකාර රේගු අධිකාරිවරුන් සඳහා පැවැත්වෙන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය (නව නිර්දේශය) - 2017 (I) (2018)

## (02) රේගු ක්‍රියා පටිපාටිය

පැ. තුනයි

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

**1.** පහත සඳහන් මාතෘකා හතරක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) දැකුම් බිල් පත (Bill of sight)

(ii) ගබඩා බිල් පත (Bill of store)

(iii) උද්ධෘතය (Extract)

(iv) නෞකා ගබඩාව (Ship's stores)

(v) නැව් බඩු ලේඛනය (Ship's cargo manifest)

*(ලකුණු 05 × 4 = 20 යි)*

**2.** "සංයෝජිත වර්ගීකරණ ක්‍රමය (Harmonized system of classification) යටතේ ඕනෑම භාණ්ඩයක වර්ගීකරණය නිවැරදිව නිර්ණය කළ හැක." මෙම ප්‍රකාශය අදාළ වර්ගීකරණ ක්‍රමයේ නියමයන් ඇසුරෙන් විග්‍රහ කරන්න. *(ලකුණු 20 යි)*

**3.** විකුණුම්කරු (Seller) සහ ගැණුම්කරු (Buyer) අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධ බවට (Related) වටිනාකම තක්සේරු කිරීම පිළිබඳ රේගු නීති (Customs valuation rules) අනුව භාණ්ඩවල වටිනාකම තක්සේරු කිරීමේ දී සලකනු ලබන්නේ කුමන අවස්ථාවන්හි දී දැ'යි පැහැදිලි කරන්න. *(ලකුණු 20 යි)*

**4.** මෙරටට පැමිණි, සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ වාසය කරන්නා වූ (විදේශීය සංචාරකයකු නොවන) මගියකු, තමා මෙරටට රැගෙන ආ රත්‍රන් වළලු 06 ක් පිළිබඳව රේගු ප්‍රකාශන පත්‍රයේ සඳහන් කර ගුවන් තොටුපලේ පැමිණීමේ පර්යන්තයේ රේගු කවුන්ටරයක සහකාර රේගු අධිකාරිවරයකු ලෙස සේවය කරන ඔබ වෙත ඉදිරිපත් කළ විටක දී ඒ සම්බන්ධයෙන් ඔබ ගන්නා පියවර කවරේදැ'යි විස්තර කරන්න. *(ලකුණු 20 යි)*

**5.** කොළඹ වරායේ පිහිටි බැඳුම්කර ගුදමක (Bonded warehouse) වසර 2 කට වඩා වැඩි කාලයක සිට ගබඩාකර තිබෙන එහෙත් මේ වන තෙක් නිශ්කාෂණය නොකළ භාණ්ඩ ලෙස පවතින විදුලි ඉස්ත්‍රික්ක (Electric smoothing irons) ප්‍රේෂණයක් පිළිබඳව ඔබට වාර්තා වූ විට කර්මාන්ත හා සේවා අංශයේ සේවය කරන සහකාර රේගු අධිකාරිවරයකු ලෙස ඔබ ගන්නා පියවර කවරේදැ'යි පැහැදිලි කරන්න. *(ලකුණු 20 යි)*

**6.** සැපයුම් දාමයේ සුරක්ෂිතතාවය (Supply chain security) තහවුරු කිරීම සඳහා දායකත්වය සපයන වෙළෙඳ වෘත්තිකයින් (Traders) රේගුව තෝරා ගන්නා අන්දම හා ඒ අනුව රේගුව විසින් ඔවුනට ප්‍රතිලාභ (Benefits) ලබාදිය හැකි අන්දම පැහැදිලි කරන්න. *(ලකුණු 20 යි)*

**7.** ආනයන භාණ්ඩ ප්‍රේෂණයන්, රේගු පරීක්ෂාව සඳහා ඉලක්කගත කොට ගැනීම (Target) රේගු අවදානම් කළමනාකරණ තාක්ෂණය (Customs Risk Management Techniques) අනුව සිදුකළ හැක්කේ කෙසේදැ'යි විස්තර කරන්න. *(ලකුණු 20 යි)*

**8.** සිය භාණ්ඩ සඳහා අදාළ බුද්ධිමය දේපළ අයිතිය (Intellectual Property Right) සුරැකීම පිණිස ආනයනකරුවකු ශ්‍රී ලංකා රේගුවට සහාය විය හැකි අන්දම විස්තර කරන්න. *(ලකුණු 20 යි)*

* * *